# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1995/10 - 2016 නොවැම්බර් මස 29 වැනි අඟහරුවාදා - 2016.11.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය

2015 සැප්තැම්බර් මස 01 වන දින අංක 1930/12 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ වූ ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව සඳහා පහත සඳහන් සංශෝධනයන් එක්කරනු ලබන අතර, එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

01. පිටු අංක 7A හි, 7.5 (ඉ) ඡේදය පහත පරිදි සංශෝධනය විය යුතු ය.

7.5 (ඉ)

(I) කිසියම් තනතුරකට විවෘත හෝ සීමිත ධාරාව යටතේ පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කර ගන්නා අයදුම්කරුවන්ගේ පුහුණු කාලසීමාව, අදාළ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය පරිදි අවස්ථාවෝචිතව වෙනස් විය යුතු වන්නේ නම්, ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගෙන අදාළ පුහුණු කාල සීමාව ඒ ඒ බඳවා ගැනීමේ පරිපාටිවල ඇතුළත් කිරීමට අදාළ පත්කිරීම් බලධරයන් විසින් කටයුතු කළ යුතු වේ.

(II) කෙසේ වෙතත්, දැනට විශේෂිත හේතූන් මත පුහුණු කාලසීමාව වසරකට සීමා කර ඇති තනතුරු සම්බන්ධයෙන් හැර, අනුමත බඳවා ගැනීමේ පරිපාටි අනුව දෙවසරක හෝ ඊට වැඩි පුහුණුවක් ලබා ගත යුතු බවට නියම කර ඇති තනතුරු සම්බන්ධයෙන් ඉහත 7.5 (ඉ) (I) වගන්තිය අදාළ නොවේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

එච්. එම්. ගාමිණී සෙනෙවිරත්න,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2016 නොවැම්බර් මස 22 වන දින.

12 - 577